# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-11-22 |

පැමිණිලි පාර්ශවය : ආර්.එම්.එන්.එන්.එස්.රත්නායක
අංක.48/79/2, රිච්මන්ඩ්හිල්,
හිරස්සගල.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

පැමිණිලි අංකය : HRC/K/377/20

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, තමාගේ දරුවා වන ආර්.එම්.නුවන් සන්ජීව රත්නායක යන අය 2020 වර්ෂයේ 'ආසන්න පදිංචිකරුවන්ගේ ගණය' යටතේ මහ/කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කිරීමේ අරමුණින් අයදුම්පත් ඉදිරිපත් කළ බවත්, පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරිම පිළිබඳ විධිවිධාන හා උපදෙස් පරිදි පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන ඇතුළු සියළු ලේඛනද ඒ සඳහා ඉදිරිපත් කළ නමුත් තම දරුවා පාසලට ඇතුළත් කොට නොගත් බවත් දක්වා ඇත.

ඒ අනුව වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, තමා හා දරුවා ඉහත සඳහන් ලිපිනයේ ස්ථිර පදිංචිකරුවන් ලෙස සිටින බවත්, තමා පදිංචි මෙම අංක 2174 දරණ ඔප්පුව තමාගේ මව වන ගුණවතී රත්නායක නමින් සින්නක්කරව මිළදී ගන්නා ලද එකක් බවත්,එසේ මවගේ නමින් මිළදී ගන්නා ලද්දේ බැංකු ණයක් ලබාගැනීමට තිබූ අවශ්‍යතාවය නිසා බවත්, නිවස ඉදිකිරිමත් සමඟ 2009 සිට තමා එහි පදිංචිව සිටින ලද බවත්, ග්‍රාම නිලධාරී විසින්ද පදිංචි සහතිකයක් මඟින් එය තහවුරු කර ඇති බවත්ය. එසේම තමා 2013 වර්ෂයේදී විවාහ වී බිරිඳ සමඟ මෙම නිවසේම පදිංචිව සිටි අතර, දේපල උකස් කර ලබාගත් බැංකු ණය හේතුවෙන් මවගේ නමින් පැවති හිමිකම තමාගේ නමට පැවරීමට නොහැකි වී තිබූ නමුත් 2014 වර්ෂයේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.com

සිට තමා හා බිරිඳගේ නම් ඡන්ද හිමි නාම ලේඛනයේ අඛණ්ඩව ලියාපදිංචි වී තිබූ බවත්, අදාළ විදුලි,ජල බිල්පත්ද තමාගේ නමට තිබූ බවත් දක්වා ඇත.

ඒ අනුව මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී එහිදී ලකුණු 89ක් උපයා ගත් බවත්, ඒ අනුව පෙරොත්තු ලේඛනයේ පළමු ස්ථානයට පත්ව සිටි බවත්, මුල් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සින්නක්කර ඔප්පුවට ලබා දුන් ලකුණු ප්‍රමාණය තම මවගේ විවාහයට පසුව නම තහවුරු කිරීම පිළිබඳ ගැටළුවක් නිසා අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අභියාචනාව මඟින් සංශෝධනය කරගත් බවත්, දක්වා ඇත. එහිදී දරුවා පාසලට ඇතුළත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය තමාට සම්පූර්ණ වශයෙන් ලබාගැනීමට අවස්ථාව තිබූ නමුත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාගැනීමේ ක්‍රමය මත තමාගේ දරුවාට ලකුණු ප්‍රමාණයෙන් අඩු වී ඇති බවත්, එසේ ලකුණු ලබාදීමේදී වර්ෂ 5ක කාලයක් තුළ මවගේ නමින් පැවති වසර 2-3 අතර කාලය සඳහා ලකුණු 15න් 40%ක් ලෙස ලකුණු 06ක්ද, තමාගේ බිරිඳගේ නමට පැවති වසර 2-3 අතර කාලය සඳහා ලකුණු 20න් 40%ක්ද, ලෙස ලකුණු 08ක් වශයෙන් මුළු ලකුණු 14ක් පමණක් ඔප්පුව සඳහා ලබා දී ඇති බවත්, දක්වා ඇත.

නමුත් අදාළ ගණය යටතේ ඇති 6.1 අනුව ඉල්ලුම්කරුගේ/කාලත්‍රයාගේ මවට හෝ පියාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම තිබේ නම් ලබාදෙන මුළු ලකුණු ගණන 15ක් ලෙස සටහන් කර ඇතත්, මෙහිදී මව විසින් දේපල හිමිකම තමා වෙත පවරා දීමෙන් සිදු වී ඇත්තේ, ලැබූ ලකුණු ගණන අඩු වීමක් බවත් සඳහන් කර ඇත. එසේ නොවුනේ නම් මුළු ලකුණු 15ම තමාට හිමි වන බවත්, තමා මහනුවර නගරයේ වෙනත් ජාතික පාසල් හා පළාත් පාසල් සඳහාද ඉල්ලුම්පත් යොමු කර තිබූ අතර, එම පාසල් වලින් ලකුණු ලබා දීමේදී ප්‍රධාන ලේඛන ලෙස සින්නක්කර ඔප්පුව සඳහා ලකුණු 17.5 ක ලබාදී තිබූ බවත්, පදිංචි නිවසේ සිට පාසලට ඇති ආසන්නතාවය මත විශාල පාසැල් ගණනක් සඳහා ලකුණු 05 බැගින් අඩුවීම මත එම විදුහල් සඳහාද අවස්ථාව අහිමි වූ බවත් දක්වා ඇත.

තමාගේ පදිංචි නිවසට ආසන්නව පිහිටා ඇති පාසල වන මහ/කිංස්වුඩ් විද්‍යාලය වෙත දරුවා ඇතුළත් කරගැනීමට එකී විද්‍යාලයේ ළමුන් ඇතුළත් කරගැනීමේ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය නිසා අවස්ථාව අහිමි වූ බවත්, වර්ෂ 10කට වඩා හිමිකමක් ඇති තමා පදිංචි දේපල පවරා දීම මත ලකුණු අඩුවීම සම්බන්ධයෙන් සලකා බලා සාධාරණ පදනමකින් දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලය වෙත ඇතුළත් කරගැනීමට අවස්ථාව සලසා දෙන ලෙසත් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරිම :-**

ඉහත පැමිණිල්ලේ වගඋත්තර පාර්ශ්වය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින්, පැමිණිලිකරු විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර තිබූ හිමිකම් ප්‍රකාශය ඉල්ලුම්කරුගේ මවට අයිති එකක් බවත්, එහි මව ලෙස ගුණවති රත්නායක යන අය සඳහන්ව තිබූ අතර,

දිව්රුම් ප්‍රකාශයක් මඟින් එය තහවුරු කර ඇති බවත්, පැමිණිලිකරුගේ උප්පැන්න සහතිකයේ ඔහුගේ මව ලෙස බටතොට කඳුරගේ ගුණවතී යනුවෙන් සඳහන් කර තිබූ බැවින් තොරතුරු පරස්පර බැවින් කරුණු තහවුරු නොවූ බවත් දක්වා ඇත.

ළමුන් ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛනයේ 7.2.1.1 වගන්තියට අනුව අයදුම්කරුගේ මව/පියාට අයිතිය ඇත්නම් එක් ලකුණු ප්‍රමාණයක් ද අයදුම්කරුට/කාලත්‍රයාට හිමිනම් තවත් ලකුණු ප්‍රමාණයක්ද ලබාදෙන බවත්, ඒ අනුව අයදුම්කරුගේ මව යයි සඳහන් අයට වසර 02 මාස 05 සඳහා ලකුණු 06ක් සහ කාලාත්‍රයාගේ නමට වසර 2 යි මාස 05 සඳහා ලකුණු 08ක් ලෙස මුළු ලකුණු 14 ලබා දී ඇති බවත්, එකී ලකුණු අංක 29/2017 චක්‍රලේඛනයට අනුකූලව ලබාදී ඇති බවත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතු වලින් අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලි පාර්ශවය තම දරුවා 2020 වර්ෂයේ මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඉල්ලුම් කර, ලකුණු 89 ලබාගෙන ඇති අතර, 2020 වර්ෂයේ පොරොත්තු ලේඛනයේ 1 වන ස්ථානයට පත්ව ඇත.

2020 වර්ෂයේ 1 වන වසරට ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛනයේ 6.1(ආ) අනුව පදිංචිය තහවුරු කරන ලේඛනය සඳහා ලකුණු ලබා දීමේදී සින්නක්කර ඔප්පුව කලත්‍රයාට පැවරී තිබූ කාලය හා එය මවගේ නමට පැවරී තිබූ කාලය යන දෙක සඳහා වෙන වෙනම ලකුණු ලබාදී ඇති බව ඉදිරිපත් වී ඇති කරුණු අනුව නිරික්ෂණය වී ඇත.

1. 29/2019 ළමුන් ඇතුළත් කිරිමේ චක්රලේඛනයට අනුව කිංස්වුඩ් විද්යාලය ලබා දී ඇති ලකුණු නිවැරදි බව නිරික්ෂණය නොවේ. ලකුණු ලබා දී ඇති ආකාරය අනුව වසර 04 කට පමණක් ලකුණු හිමිව ඇති බව නිරික්ෂණය වේ. එනම්,

| | | | |
|---|---|---|---|
| මවගේ හිමිකාරීත්වයට | අවු 2 යි මාස 5 ට | - | ලකුණු 6 (වසර 02) |
| කලත්‍රයාගේ හිමිකාරීත්වය | අවු 2 යි මාස 5 ට | - | ලකුණු 8 (වසර 02) |

ඒ අනුව වසර 01 ක් සඳහා ලකුණු ලැබී නොමැත.

2. ඒ අනුව නිවැරදි ලකුණ විය යුත්තේ,

| | | | |
|---|---|---|---|
| මවගේ උරුමයට | අවු 2 මාස 09 ට | - | ලකුණු 7.25 |
| කලත්‍රයාගේ උරුමයට | අවු 2 මාස 05 ට | - | ලකුණු 10.33 |
| | | | ----------------- |
| | | | ලකුණු 17.58 |
| | | | =========== ලෙස වන බව |

නිරික්ෂණය වේ.

මේ අනුව, මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඔප්පුව සඳහා ලකුණු ලබා දීමේදී පැමිණිලිකරුගේ මවට පැවරී තිබූ කාලය වන වසර 2-3 අතර කාලය සඳහා 15x40/100 = ලකුණු 06ක් හා කලත්‍රයාට පැවරී තිබූ කාලය සඳහා 20 x40/100=ලකුණු 08 ලෙස ලකුණු 14ක් ලබාදී ඇත.

එසේම විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සින්නක්කර ඔප්පුව මවට පැවරී තිබූ කාලය වසර 2ක් 3ත් අතර සඳහා ලකුණු 15න් 50% ලෙස ලකුණු 7.5ත් හා කලත්‍රයාගේ නමට තිබූ කාලය සඳහා ලකුණු 20න් 50% ලෙස ලකුණු 10ක් ලෙස මුළු ලකුණු 17.5ක්ද ලබා දී ඇත. ඒ අනුව මුළු ලකුණු සංඛ්‍යාව 92.5ක් ලැබී ඇති නමුත් ආසන්න පාසල් සඳහා ලකුණු අඩු කිරීමේදී ලකුණු 50න් 35ක් අහිමි වීම මත අදාළ විද්‍යාලයට තෝරාගෙන නොමැති බව අනාවරණය වේ.

ඒ අනුව එකම චක්‍රලේඛනය භාවිතා කරමින් ලකුණු ලබාදීමේදී මහනුවර කිංස්වුඩ් විද්‍යාලය මඟින් හිමිකම පැවරී තිබූ කාල සීමාව ගණනය කිරීමේදී නිවැරදි නොවන ආකාරයට ගණනය කිරීම මඟින් පැමිණිලි පාර්ශවය හට ලකුණු 3-5ත් අඩුවීම මත දරුවා අදාළ පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බව අනාවරණය වේ.

නිගමනය :-

පැමිණිල්ලට අදාළව සිදුකරන ලද විමර්ශන/පරීක්ෂණ කටයුතුවලදී අනාවරණය වන කරුණු අනුව වගඋත්තර පාර්ශවීය මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සම්මුඛ හා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය, දරුවන් පළමු වසරට ඇතුළත් කර ගැනීමේ චක්‍රලේඛනය අනුව ලකුණු ලබාදීමේදී නිවැරදි නොවන ආකාරයට කටයුතු කිරීමෙන් ලැබිය යුතු ලකුණු 3-5 අහිමි වීමෙන් පැමිණිලිකරුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකරුගේ දරුවා වන ආර්.එම්.නුවන් සන්ජීව රත්නායක දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2022 වර්ෂයේ 3 වන වසරට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙසට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 12 . 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

1. අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

3. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
   මහනුවර.

B/